00003

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**ESD1232/EPD3532 -** විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ - ගණිතය

කාලය - පැය තුනයි. (03)

දිනය - 2023.07.09 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ජීන් පියාජේගේ බුද්ධි සංවර්ධන අවධින් වයසත් සමඟ වගුගත කරන්න.

02. ස්කීමාවල කාර්යයන් විස්තර කරන්න.

03. ප්‍රාථමික ගණිතයේ ප්‍රධාන තේමා (සංකල්ප) ලැයිස්තු ගත කරන්න.

04. ප්‍රාථමික මට්ටමේ දී ගණිතය ඉගැන්වීම/ඉගෙනීම තුළින් ලබා කර ගැනීමට අපේක්ෂා කරන අරමුණු පහක් (05) සඳහන් කරන්න.

05. (a) ශ්‍රී ලංකාවේ වර්තමාන ප්‍රාථමික අධ්‍යාපන පද්ධතියේ ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ ප්‍රධාන උපාංග තුන (03) මොනවා ද?

    (b) එක් එක් ප්‍රධාන අවධියෙන් අවධියට එම උපාංග වෙනස් වන අයුරු රූප සටහනක් ඇඳ පැහැදිලි කරන්න.

06. ප්‍රාග් ඓතිහාසික යුගයේ ගණිතය පැවති බවට සාක්ෂි හතරක් (04) සපයන්න.

07. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (NEC) පළමු වාර්තාවේ සඳහන් කර ඇති ප්‍රාථමික මට්ටමේ දී සංවර්ධනය කළයුතු මූලික නිපුණතා පහක් (05) ලැයිස්තු ගත කරන්න.

08. දූර්භාෂ්‍ය (Dylexia) හි ලක්ෂණ විස්තර කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) "ඉගෙනුම් ආධාරක " යන යෙදුම ඔබේ වචනයෙන් නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) ප්‍රාථමික පන්ති වලදී ගණිතය ඉගැන්වීමේ දී ඉගෙනුම් ආධාරක භාවිතයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) a) ඩීන්ස් කට්ටලය යනු කුමක්දැයි සුදුසු පින්තූරයක් භාවිත කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

b) පහත සඳහන් එක් එක් දේ ඩීන්ස් කට්ටලය භාවිත කරමින් පෙන්වා දෙන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

i. 2023 (ස්ථානීය අගයන්)

ii. 234 + 458 (එකතු කිරීම)

iii. 608 - 437 (අඩු කිරීම)

10. (i) a) පහත දැක්වෙන එක් එක් යෙදුම් විස්තර කරන්න.

i. ක්‍රමාණුකූල දෝෂ (නියත දෝෂ)

ii. නොසැලකිලිමත් දෝෂ

iii. අහඹු දෝෂ (ලකුණු 03 x 01 = 03)

b) එකතු කිරීමට අදාළ සිදුවිය හැකි ඕනෑම දෝෂ (වැරදි පහක්) ලැයිස්තුගත කර එම එක් එක් දෝෂය සඳහා උදාහරණ දෙක **(02)** බැගින් ලබා දෙන්න. (ලකුණු 05)

c)

| | | | | |
|---|---|---|---|---|
| 23 | 80 | 69 | 37 | 23 |
| + 41 | + 75 | + 83 | + 36 | + 94 |
| 10 | 20 | 26 | 19 | 18 |

ඉහත දැක්වෙන එකතු කිරීමට අදාළ ගණිත ගැටලු 3 ශ්‍රේණියේ සිසුවෙකු විසින් විසඳූ ඒවා ය.

ඉහත දක්වා ඇති සිසුවාගේ පිළිතුරු හොඳින් නිරීක්ෂණය කරන්න. එම සිසුවා පහත දැක්වෙන එකතු කිරීමට අදාළ ගැටලු විසඳුවේ නම් පිළිතුරු කෙබඳු විය හැකි ද?

| | | | | |
|---|---|---|---|---|
| 73 | 37 | 94 | 54 | 12 |
| + 23 | + 81 | +63 | + 47 | +92 |

පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08)

d) ඉහත ආකාරයේ වැරදි මගහැරවීම සඳහා ප්‍රතිකාරාත්මක ඉගැන්වීමේ ක්‍රමයක් යෝජනා කරන්න. (ලකුණු 04)

11. i) 1960 දශකය දක්වා ප්‍රාථමික අධ්‍යාපනය තුළ භාවිතා කළ "3R" මොනවා ද?(ලකුණු 03)

ii) 1998 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් හඳුන්වා දෙන ලද විෂයමාලා සැලැස්ම ඇඳ පැහැදිලි කරන්න. (ලකුණු 17)

12. "ප්‍රාථමික ගණිත පාඩම් සටහනක පියවර හතක් (07) අන්තර්ගත වේ. පළමු පියවර වන්නේ පාඩම් අරමුණු පිළිබඳ පැහැදිලි ප්‍රකාශ හයයි."

i) අනෙක් පියවර හය (06) ලැයිස්තු ගත කරන්න. (ලකුණු 06)

ii) ස්ථානීය අගයන් දෙකකින් යුත් සංඛ්‍යාවක් තවත් එවැනි සංඛ්‍යාවක් සමඟ එකතු කිරීම පාඩමේ අරමුණ වේ.

ඉහත අරමුණට අදාළ පාඩම් සටහනක් ලියන්න. (ලකුණු 14)

13. i) "තක්සේරුකරණය" යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 05)

ii) පහත සඳහන් දේ පැහැදිලි කරන්න.

a) ප්‍රතිමාණ මූලික තක්සේරුව සහ නිර්ණායක මූලික තක්සේරුව

b) සම්භවන තක්සේරුව සහ සම්පිණ්ඩිත තක්සේරුකරණය (ලකුණු 05)

iii) "ප්‍රාථමික පාසල් මට්ටමේ දී සම්පිණ්ඩිත තක්සේරුකරණයට වඩා සම්භවන තක්සේරුකරණය වඩාත් යෝග්‍ය වේ."

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.